● දේපළ ණය සම්පූර්ණයෙන් පියවා අවසන් කළ විට ඔප්පුව නිදහස් කරගැනීමේ කටයුතු සඳහා ලිඛිතව ඉල්ලීමක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර එම ලිපියෙහි ඔබගේ වාසගම සහිත සම්පූර්ණ නම, දේපළ ණය ලබා ගත් වර්ෂය, දේපළ ණය ලබාගැනීමේදී සේවය කළ පාසල / ස්ථානය,විශ්‍රාම යාමේදී අවසන් වරට සේවය කළ පාසල/ස්ථානය , ජා.හැ.අංකය සහ අවශ්‍යතාවයකදී ඔබව දැනුවත් කළ හැකි දුරකථන අංකය සඳහන් විය යුතුය.

● පොදු 263,264 සහ 265 හි ණයකරු ලෙස ඇති ස්ථනයෙහි ඔබගේ අත්සන යොදන්න.

● දේපළ ණය සම්පූර්ණයෙන් පියවා අවසන් බවට ගිණුම් අංශයෙන් තහවුරු කළ පසු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව සකස් කළ ලේඛන අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්‍යාලය වෙත යවනු ලබන අතර එහිදී අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලය අවලංගු කර නැවත එවූ පසු ඔප්පුව නිදහස් කර ගැනීම සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත රැගෙන කලාප අධ්‍යාපන කාර්‍යාලය වෙත පැමිණෙන ලෙස දැනුවත් කරනු ලැබේ.